www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ඇමති ඝාතනයෙන් පසුව, කොලඹ යුද ඝෝෂාව වැඩෙයි

## After killing of Sri Lankan minister, clamour for war grows in Colombo

**කේ. රත්නායක විසිනි**

**2005 අගෝස්තු 20**

පසුගිය සතියේ ශ්‍රී ලංකාවේ විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීමෙන් පසුව, කොලඹ පාලක කව තුල යුද බෙර ගැසීමක් පැහැදිලිව වැඩෙමින් පවතී.

සෑම දේශපාලන පක්ෂයක් ම පාහේ එක සැනින් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය මත වරද පටවා, ඝාතනයෙන් පසුව ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් පනවන ලද හදිසි නීතිය මසකින් දීර්ඝ කිරීමේ යෝජනාව සම්මත කරනු පිනිස බ්‍රහස්පතින්දා එකට එක්විය. පාර්ලිමේන්තු විවාදය තුල දී, කදිරගාමර්ව වග වර්නනා කිරීමටත් එල්ටීටීඊය හෙලා දැකීමට හා 2002 පෙබරවාරියේ සිට බල පැවැත්වෙන වත්මන් සටන් විරාමය සංශෝධනය කල යුතු ය යන ප්‍රකෝපකාරි ඉල්ලීම ඉදිරිපත් කිරීමටත් කතිකයෝ එකිනෙකා සමග පොර කෑහ.

තමන් ඝාතනයට සම්බන්ධ නැති බවට එල්ටීටීඊය කර තිබෙන ප්‍රකාශ ගනනකට නොගෙන ඇති මාධ්‍ය සහ දේශපාලන සංස්ථාපිතය, එල්ටීටීඊය ඝාතනය සිදු කල බවට පොලීසිය හා මිලිටරිය කරන ප්‍රකාශ පිලිගෙන ඇත. එල්ටීටීඊය නායකත්වය ඝාතනය සඳහා අන දී තිබීම නිසැකව ම විය හැක්කකි. එනමුදු පොලීසිය විසින් එය ඔප්පු කරනු වස් මේ දක්වා සපයා ඇති “සාධක” සීමිත හා ඔප්පු නො කෙරුනු පරිවේෂනීය සාක්ෂිවලට සීමා වෙයි.

කොලඹ කිසිවෙක් මූලික ප්‍රශ්නය මතු කිරීමට නිර්භීත වී නැත: එනම් ඝාතනයේ වාසිය කාටද? වඩාත්ම පැහැදිලි ලෙස එයින් දේශපාලන වාසිය ලබා ගෙන ඇත්තේ එල්ටීටීඊය පිලිබඳව මහ හඬින් මොර දෙන අයයි: එනම්, ආරක්ෂක හමුදාවල කොටස් සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය ඇතුලු සිංහල ස්වෝත්තමවාදී පක්ෂ යි. පශ්චාත්-සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය (පී-ටොම්ස්) පිලිබඳ ගිවිසුම අත්සන් කලාට පසුව, එය ජාතිය පාවාදීමක් ලෙස හෙලා දකිමින් ජූනි මස ජවිපෙ ආන්ඩුවෙන් ඉවත් විය. මෙම ෆැසිස්ට්වාදී කට්ටුවලට අයත් කොටස් විසින් කදිරගාමර් ඝාතනය සඳහා කුමන්ත්‍රනය කිරීමක් එල්ටීටීඊ ඝාතනයක් මෙන් ම විය හැක්කකි.

ඝාතනය සිදුවීමත් සමගම, ජවිපෙ සහ හෙල උරුමය, මාධ්‍යවල කොටසකගේ ද පිටුබලය සහිතව, ප්‍රහාරාත්මක දේශපාලන ව්‍යාපාරයකට බැසගෙන ඇත. ප්‍රසිද්ධියේ “කොටින්ට” වරද පැටවීමට පැකිලෙන ඕනෑම අයෙක් එල්ටීටීඊ ඒජන්තයකු හෝ ඊටත් වඩා දරුනු ලෙස හෙලා දැකීමට ලක් වේ. කදිරගාමර්ගේ අභාවයට පෙර ඔහු සම්බන්ධයෙන් විවේචනශීලී වූ සමහර පුවත්පත් එල්ටීටීඊයට තොරතුරු කාන්දු කලේ යැයි හෙලා දැකීමට ලක්ව තිබේ. කොලඹ පවතින කුනු ගඳ ගසන වාර්ගික දේශපාලන වාතාවරනය තුල මෙවන් අදහස් දැක්වීම් ප්‍රචන්ඩ ප්‍රතිවිපාක ගෙන ආ හැකි තර්ජනයන් ය. සිංහල ස්වෝත්තමවාදයේ ම ගිලී පවතින ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙක -- කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සහ විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) -- මෙම උද්ඝෝෂනයට අනුගත වී ඇත.

දේශපාලන පක්ෂ පී-ටොම්ස් ගිවිසුම සම්බන්ධයෙන් මාස ගනනාවක් තිස්සේ යටි උගුල් ඇදීම්වල හා කාකොටාගැනීම්වල නිමග්න වී සිටියත් හදිසි නීතිය පැනවීමට සහයෝගය දෙනු වස් ඔවුන් බ්‍රහස්පතින්දා එකට එකතු වීම අර්ථභාරී ය. ඡන්ද 21ට 124ක් ලබා ගනිමින් හා ඉතිරි මන්ත්‍රීන් 80 දෙනා පාර්ලිමේන්තුවට නොපැමිනීම හෝ ඡන්දය දීමෙන් වැලකී සිටීම මගින්, එය විශාල වැඩි ඡන්දයකින් සම්මත විය. ඔවුන් අතර පවත්නා තියුනු මතභේද තිබිය දී ම, තමන් ගැඹුරු දේශපාලන අර්බුදයකට මුහුන දී සිටින බව වටහා ගෙන සිටින පාලක ප්‍රභූ කොටස්, අන් සියල්ලටමත් වඩා සාමාන්‍ය ජනතාව එම තත්වයට මැදිහත්වීම වලකාලීම එල්ලය කරගත් ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර ගනනාවක් පනවනු වස් එකට එකතු වී තිබේ.

හදිසි නීතිය, ආරක්ෂක ඇමති සහ ආරක්ෂක හමුදාවල අන දෙන නිලධාරි ලෙස ජනාධිපතිට පුලුල් බලතල ලබා දෙයි. “සැකකරුවන්” අත්අඩංගුවට ගෙන නඩු විභාගයකින් තොරව ඔවුන් රඳවා තබා ගැනීමේ, නිවාස සෝදිසි කිරීමේ සහ ප්‍රසිද්ධ රැස්වීම් හා විරෝධතා තහනම් කිරීමේ හැකියාව සන්නද්ධ හමුදාවලට සහ පොලීසියට ලැබී ඇත. ඕනෑම වැඩ ක්ෂේත්‍රයක් “අත්‍යවශ්‍ය සේවාවක්” ලෙස සලකා වර්ජන හා විරෝධතා නීති විරෝධී කිරීමට කුමාරතුංගට හැකි ය.

දැඩි ප්‍රවෘත්ති වාරන පැනවීමේ හැකියාව ද ඇයට ලැබී ඇත.

කොලඹ පාලක කව තුල යන දේශපාලන සාකච්ඡාවේ ස්වභාවය පාර්ලිමේන්තුවේ දී ප්‍රදර්ශනය විය. නියෝජ්‍ය ආරක්ෂක ඇමති සහ ජාතික ආරක්ෂක ඇමති රත්නසිරි වික්‍රමනායක, කදිරගාමර් ඝාතනය හදිසි නීතිය දීර්ඝ කිරීමට එකම හේතුව නො වේ යැයි ප්‍රකාශ කරමින් හදිසි නීති පනත ඉදිරිපත් කලේ ය. යුද තර්ජනයකට සමාන ප්‍රකාශයක් නිකුත් කරමින්, ඔහු මෙසේ පැවසී යඃ "අප ඔවුන්ගෙන් (එල්ටීටීඊයෙන්) ඉල්ලා සිටින්නේ විවෘත මනසකින් යුතුව සාකච්ඡාවලට පැමිනෙන ලෙසයි. ඔවුන් එසේ නො කල හොත් නැතිනම් එයට අකමැති වුව හොත්, වෙනත් ප්‍රවිෂ්ටයක් අනුගමනය කිරීමට හෝ තීන්දුවක් ගැනීමට අපට සිදු වනු ඇත."

ජවිපෙ වාචාල කතික විමල් වීරවංශ, පාර්ලිමේන්තුව අමතමින්, රට "ඒක-පාර්ශ්වික යුද්ධයකට" මුහුන දී සිටින බව පවසා සටන් විරාම ගිවිසුම "විකෘත කෙරුනු, පච ලියවිල්ලක්" ලෙස හංවඩු ගැසී ය. "සටන් විරාමයට පෙර මිලිටරිය හා එල්ටීටීඊය එකිනෙකාට එරෙහිව යුද්ධ කලා. එහෙත් දැන් ආන්ඩුව සාමය ගැන කතා කරමින් සිටින අතර එල්ටීටීඊය යුද්ධයක් ගෙන යනවා." යැයි ඔහු පැවසී ය. පැහැදිලි නිගමනය නම්, එල්ටීටීඊය නව කොන්දේසිවලට එකග නො වන්නේ නම්, යලි යුද්ධය කරා යන බව යි.

බෞද්ධ භික්ෂූන් විසින් නායකත්වය දෙනු ලබන හෙල උරුමය විවෘත යුද උද්ඝෝෂනයකට බැස ගෙන ඇත. හෙල උරුමයේ නායක එල්ලාවල මේධානන්ද ථෙර ඉල්ලීම් පහක් ඉදිරිපත් කර තිබේඃ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (පිටීඒ) යලි පැනවීම, එල්ටීටීඊය තහනම් කිරීම, නෝර්වේජියානු සාම මැදිහත්කරුවන් පිටුවාහල් කිරීම, "ත්‍රස්තවාදය මැඩීම" පිනිස හදිසි නීති බලතල පැනවීම සහ එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් හා ඔහුගේ බිරිඳ බ්‍රිතාන්‍යයෙන් උදර්පනය කර ගැනීම. මෙම ඉල්ලීම් පිලිගත හොත්, එය යුද ප්‍රකාශ කිරීමකට සම වනු ඇත.

## ඇල් මැරුනු විරුද්ධත්වය

විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ එල්ටීටීඊය සමග සාම සාකච්ඡා යලි ඇරඹීම සඳහා නව ආන්ඩුවක් අවශ්‍ය යැයි මේ සතියේ කියා සිටියේ ය. කෙසේ වෙතත්, පාර්ලිමේන්තුවේ දී, එජාපය, හදිසි නීතියට ඡන්දය දුන්නේ එහි බලතල දූෂ්පරිහරනය නො කරන ලෙස ඇල් මැරුනු ආයාචනයක් ආන්ඩුවට ඉදිරිපත් කිරීමට පමනක් සීමා වෙමිනි. "සාමාන්‍ය තත්වයට බාධා පැමිනවීමට හදිසි නීති රෙගුලාසි දූෂ්පරිහරනය නො කෙරෙනු ඇතැයි අපි අවංකව ම බලාපොරොත්තු වෙමු." යැයි එජාප නියෝජ්‍ය නායක කරු ජයසූරිය ප්‍රකාශ කලේ ය. බලයේ සිටින කාලය තුල, අත්තනෝමතික විධායක ජනාධිපති බලතල දූෂ්පරිහරනය කිරීම සම්බන්ධයෙන් දක්ෂිනාංශික එජාපය කුප්‍රකට ය.

කම්කරු පන්තියේ පැරනි පක්ෂ වන ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සහ ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය (කොප) පාලක සභාගයේ කොටස්කරුවන් වන අතර කුමාරතුංගගේ ශ්‍රීලනිපයෙන් වෙන් කොට හඳුනාගැනීමට බැරි තරම් ය. ඔවුන්ගේ මන්ත්‍රීවරු විරෝධතා කෙඳිරිල්ලකින් පවා තොරව ප්‍රජාතන්ත්‍ර විරෝධී හදිසි නීතියට ඡන්දය දුන්හ.

වර්තමානයේ දී එල්ටීටීඊයේ හොරනෑවක් ලෙස ක්‍රියා කරන ධනේශ්වර දෙමල පක්ෂවලින් සැදි කන්ඩායමක් වන දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) හදිසි නීතියට විරුද්ධව ඡන්දය දුනි. ආන්ඩුව "යටි අරමුනුවලින්" යුක්තව එල්ටීටීඊය පිලිබඳ නිගමනයන්ට පැන ගෙන ඇතැයි ටීඑන්ඒ මන්ත්‍රී ජී. පොන්නම්බලම් බියසුලු ලෙස යෝජනා කලේ ය. දෙමල වතු කම්කරුවන් අතර පදනම් වන කඳුරට මහජන පෙරමුන හදිසි නීති රෙගුලාසිවලට විරුද්ධව ඡන්දය දුන්නේ ය. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය (ශ්‍රීලමුකො), ඒවායේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය පෙන්වා දෙන අතර ම, ඡන්දය දීමෙන් වැලකී සිටියේ ය.

ඡන්ද විමසීමෙන් යන්තම් පැය කිහිපයකට පසුව, කුමාරතුංග, "සටන් විරාමය සමාලෝචනය" කරනු පිනිස එල්ටීටීඊය සමග හදිසි සාකච්ඡාවක් ඉල්ලමින් නෝර්වේජියානු අගමැති ක්ජෙල් බොන්ඩෙවික් වෙත ලිපියක් යැවුවා ය. එල්ටීටීඊය සෘජු සාකච්ඡාවලට එකග වී ඇතැයි නෝර්වේජියානු මැදිහත්කරුවෝ ඊයේ නිවේදනය කලහ. සාම ක්‍රියාදාමය යලි පන ගැන්වීමේ ලකුනු දැකිය හැකි යැයි සමහර අටුවාකරුවන් නිකුත් කල ප්‍රකාශවලට එම නිවේදනය තුඩු දී ඇත.

සාකච්ඡා, සටන් විරාමයට රැකුලක් වනවාට වඩා, එහි පරිපූර්න බිඳවැටීමට තුඩු දීමේ විභවයකින් යුක්ත ය. ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවේ (එස්එල්එම්එම්) ප්‍රධානි හැග්‍රප් හෝක්ලන්ඩ් රොයිටර් ප්‍රවෘත්ති සේවයට මෙසේ පැවසී යඃ "පවතින්නේ එය (සටන් විරාමය) සමාලෝචනය කිරීම පිලිබඳ ප්‍රශ්නයක් නොව, එය ක්‍රියාත්මක කරන ආකාරය සාකච්ඡා කිරීම පිලිබඳ ප්‍රශ්නයකි." වෙනත් වචනවලින් කිය තොත්, එල්ටීටීඊය හා නෝර්වේජියානු මැදිහත්කරුවන් සම්බන්ධයෙන් සලකන තාක් දුරට, සටන් විරාම ගිවිසුම සංශෝධනය කිරීම පිලිබඳ ප්‍රශ්නයක් නො පවතී. කෙසේ වෙතත්, කොලඹ පවතින්නේ එම ලියවිල්ල යලි කෙටුම්පත් කිරීම පිලිබඳ වැඩෙන ඝෝෂාවකි.

දක්ෂිනාංශික අයිලන්ඩ් පත්‍රය අඟහරුවාදා පල කල කතුවැකියකින් කෙලින් ම ඉල්ලා සිටියේ සටන් විරාම ගිවිසුම (සීඑෆ්ඒ) යලි සාකච්ඡාවට භාජනය කල යුතු

බව යි. "මෙය ආන්ඩුව කෙලින් සිටිය යුතු අවස්ථාව යි. සීඑෆ්ඒ යටතේ ඔවුන් අත්විඳින සහන එල්ටීටීඊයට අහිමි කල යුතු ය. ඔවුන්ට ආන්ඩුවේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශවලට ඇතුලු වීමට අවසර දුන්නේ තමන්ගේ යලි හැඩගැස්ම සකසා ගනු වස් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයෙහි නිරත වනු පිනිස ය. එහෙත්, ඔවුන් ඒකපාර්ශ්විකව සාකච්ඡා අත්හිටුවා විරුද්ධවාදීන් ඝාතනය කිරීම හා සිය ත්‍රස්ත පාලනය පුලුල් කරගැනීම සඳහා එම සහන දුෂ්පරිහරනය කරන බැවින් ඔවුන්ගේ "දේශපාලන වැඩ" තහනම් කොට එම ප්‍රදේශවලින් වහාම පිටව යන ලෙස එල්ටීටීඊ කාඩර්වරුන්ගෙන් ඉල්ලා සිටිය යුතු ය. එල්ටීටීඊ ඝාතකයන්ගේ විනිවිදීම වලකාලීමට අවශ්‍ය යැයි සැලකෙන ඕනෑම ප්‍රදේශයක කඩා පැනීම් හා සෝදිසි මෙහෙයුම් යලි ඇරඹිය යුතු ය." යැයි එය සඳහන් කරයි.

සිය ඒකපාර්ශ්වීය අටුවාව තුල අයිලන්ඩ් කතුවැකිය සඳහන් නො කරන දෙය නම්, වාර්ගික ආතතින් හිතාමතාම අවුලුවාලනු ලබන්නේ, විශේෂයෙන් ම උතුරේ හා නැගෙනහිර, තමන් සාධනීය ලෙස දකින කොටස් -- ජවිපෙ, හෙල උරුමය සහ ආරක්ෂක හමුදා -- විසින් ය යන කරුන යි. "ඝාතනවල" යෙදෙන්නේ එල්ටීටීඊය පමනක් නො වේ, මිලිටරියේ කොටස්වල නිහඬ සහයෝගය ලබන කරුනා නමින් ද ප්‍රසිද්ධ වි. මුරලිදරන්ගේ නායකත්වයෙන් යුත් එල්ටීටීඊයෙන් කැඩුනු කන්ඩායමක් ද ඝාතනවල යෙදෙයි. නැගෙනහිර එල්ටීටීඊ කාර්යාල නිරතුරුව ම ප්‍රහාරවලට ලක් වන අතර ඔවුන්ගේ කේඩර ද ඝාතනය කෙරෙයි. එහෙත් ඒ පිලිබඳ වචනයක හෝ විවේචනයක් කොලඹ පුවත්පත්වල පල නො වේ.

සිකුරාදා පල වූ තව කතුවැකියකින්, අයිලන්ඩ් පුවත්පත, සටන් විරාමය පවත්වා ගෙන යා යුතු යැයි බල කිරීම සම්බන්ධයෙන් මහ බලවතුන්ට දරුනු ප්‍රහාරයක් එල්ල කලේ ය. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" කුහක ස්වභාවයට ඇඟිල්ල දිගු කරමින් එය මෙසේ ප්‍රකාශ කලේ යඃ "මොනම ප්‍රශ්නයක් වත් ඇසීමකින් තොරව, ප්‍රසිද්ධ ස්ථානවල දී, මරාගෙන මැරෙන බෝම්බකරුවන් යැයි සැක සිතෙන පුද්ගලයන්ගේ මොල කෑලි එලියට පනින ආකාරයෙන් වෙඩි තැබීම ගැන බ්‍රිතාන්‍යයට කිසිදු දෙගිඩියාවක් නැති නම්, . . . ත්‍රස්තවාදීන්ගෙන් කල් තියා ආරක්ෂා වනු වස් පූර්ව-භංග ප්‍රහාරවලට යාමට එක්සත් ජනපදයට හැකි නම්, ශ්‍රී ලංකාවට ද, පවත්නා කොන්දේසි මත පාදකව, සීඑෆ්ඒ සමාලෝචනය කිරීමට හෝ එය අත්හිටුවීමට හෝ නැති නම් එය අහෝසි කිරීමට පවා හැකි විය යුතු ය."

පැහැදිලිව ම අයිලන්ඩ් පුවත්පත ප්‍රකාශයට පත් කරන්නේ, බ්‍රිතාන්‍යය හා එක්සත් ජනපදය කොලඹ පාලනයේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" සහාය දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූවේ ස්ථර අතර පවත්නා අසහනය යි. වොෂිංටනය හා ලන්ඩනය සටන් විරාමයට සහාය දෙන්නේ නම්, ඒ ශ්‍රී ලංකාවේ සාමය පිලිබඳ යම් නෛසර්ගික උත්සුකතාවකින් නම් නො වේ. ඒ වෙනුවට, දකුනු ආසියාව තුල -- විශේෂයෙන් ම ප්‍රධාන ලාභ ශ්‍රම වේදිකාවක් ලෙස මතුව ඇති ඉන්දියාව තුල -- වඩා පුලුල් එක්සත් ජනපද ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට තර්ජනය කරන භයානක අස්ථාවරකරන සාධකයක් ලෙස ශ්‍රී ලංකාවේ දිග්ගැසුනු සිවිල් යුද්ධය සැලෙකෙන බැවිනි. වර්තමානයේ දී වොෂිංටනය යුද්ධය අවසන් කිරීමට සාකච්ඡාමය එකඟතාවක් සඳහා බල කරයි. එහෙත් එම උපාය වෙනස් විය හැකි ය.

## දේශපාලන හිරවීම

යුද්ධය කරා රට යලි ඇදවැටීමක ද වැඩ කරන ජනතාවගේ විරුද්ධත්වය මඩිනු වස් ආඥාදායක විධික්‍රම යොදා ගැනීමේ ද අන්තරයාන් පිලිබඳව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය යලි යලිත් අනතුරු අඟවා ඇත. පාර්ලිමේන්තු පාලනය ශීඝ්‍රයෙන් වියැකීමට ලක් වෙමින් පවතී. ආන්ඩු එකකට පසු එකක් වසයෙන්, සාමය හා ශිෂ්ඨ සම්පන්න ජීවන කොන්දේසි සඳහා මහජනතාවන්ට පවත්නා අභිලාෂයන් සන්තර්පනය කිරීමෙහි ලා සිය නොහැකියාව ඔප්පු කර ඇත්තේ, සමස්ත සංස්ථාපිතය ම සම්බන්ධයෙන් ප්‍රගාඪ විරසකයකට හා වෛරයකට තුඩු දෙමිනි. දිවයිනේ විශාල ප්‍රදේශයක් විනාශයට ලක් කරමින්, 30,000කට වඩා ජනයා මරුමුවට පත් කොට 250,000කට පමන උන්හිටි තැන් අහිමි කල දෙසැම්බර් 26 සුනාමිය මෙම දේශපාලන ක්‍රියාදාමයන් බොහෝ සෙයින් වේගවත් කලේ ය.

අගෝස්තු 1 දා නිකුත් කල නිවේදනයක සසප මෙසේ ප්‍රකාශ කලේ යඃ "පසුගිය වර්ෂ පහ ඇතුලත - 2000, 2001, 2004 - මහ මැතිවරන තුනක් පවත්වනු ලැබ තිබේ. එහෙත් ඒ එකක් වත් කිසි දෙයක් විසඳා නැත. කෙරී ඇත්තේ සරලව ම තවත් අර්බුදයකට පදනම දැමීම පමනි. ප්‍රධාන දේශපාලන පක්ෂ, ඒකාබද්ධ මූලෝපායකට එකඟ වීමට හා සාමාන්‍ය මහජනතාවගේ අවශ්‍යතා සහ අපේක්ෂා පදනම් කොට ගෙන එම ජනතාවට ආමන්ත්‍රනය කිරීමට අසමත් ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් අපේක්ෂා කරන්නේ, පාර්ලිමේන්තුවෙන් පිටස්තර ක්‍රමයකින් වත්මන් අගුල්හිරය අවසන්කර දැමීමට ය."

හදිසි නීතිය පැනවීමට බ්‍රහස්පතින්දා පැවති පාර්ලිමේන්තු ඡන්ද විමසීම මගින් එම නිගමනය සනාථ වී තිබේ. යුද තර්ජනය ඉස්මතුව ඇති තතු යටතේ, පාලක ප්‍රභූ කොටස්, වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් තලා දැමීමත් මොන යම් හෝ දේශපාලන විරුද්ධත්වයක් මැඩීමට අවශ්‍ය බලතලවලින් සන්නද්ධ

වී ගැනීමත් පිනිස සිය මතභේද තාවකාලිකව පසෙකට දැමී ය. මෙය වනාහි 2002 පෙබරවාරි සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමට ක්ෂනිකව පෙරාතුව සිට මේ දක්වා කාලය තුල හදිසි නීතිය පනවන ලද දෙවන අවස්ථාව පමනි. මේ වසර මුල දී කුමාරතුංග ඒ සඳහා සුනාමි කඩතුරාව යොදා ගත්තා ය.

කදිරගාමර්ගේ ඝාතනය පිලිබඳ "සැකකරුවන්" අත් අඩංගුවට ගැනීමට හදිනි නීති රෙගුලාසි දැනටමත් යොදා ගෙන තිබේ. කෙසේ වෙතත්, ඉදිරි එල්ටීටීඊ ප්‍රහාරවලට මුහුන දීමේ කඩතුරාව යටතේ වඩා පුලුල් ආකාරයෙන් එම පියවර යොදා ගනු ලැබේ. මුර සංචාර සහ රාත්‍රී කඩා පැනීම් -- විශේෂයෙන් ම දෙමල නිවහන් ප්‍රදේශවල -- ඉහල දමා තිබේ. විශාල දෙමල ජනගහනයකින් යුක්ත ප්‍රදේශ කරා යන හා එම ප්‍රදේශවල සිට එන බස් රථ ඇතුලු වාහන දැඩි ආරක්ෂක සෝදිසිවලට ලක් කෙරෙයි. දෙමල ජනයාට එරෙහිව අවලාදාත්මක වර්ගවාදී ප්‍රකාශ යොදා ගැනීම පිලිබඳ නිරතුරු වාර්තා මගින් ආරක්ෂක හමුදාවල ආකල්පය පැහැදිලි වේ. මහනුවර හා දඹුල්ල වැනි කොලඹින් පිට ප්‍රදේශවල ද අත් අඩංගුවට ගැනීම් සිදුව තිබේ.

හදිසි නීතිය යොදා ගැනීම දෙමල ජනයාට පමනක් සීමා නො වනු ඇත. ජීවන කොන්දේසි කඩා වැටීමට, පශ්චාත්-සුනාමි යලි ඉදිකිරීම් පමා වීමට, ප්‍රවාහන වියදම්, පෙට්‍රල් හා සෙසු භාන්ඩවල මිල ගනන් ඉහල යාමට, සහ රැකියා හා සේවා කොන්දේසි මත ආර්ථික ප්‍රතිව්‍යුහකරනය හා පුද්ගලීකරනය මගින් ඇති කෙරෙන බලපෑමට විරුද්ධව වැඩ කරන ජනතාව වෙතින් මතුව ඇති විරෝධතා සමග, වැඩෙන සමාජ අසනහකාරී තත්වයක් පවතී. පසුගිය දෙසතිය තුල පමනක්, ඉහල වැටුප් ඉල්ලමින් සෞඛ්‍ය සේවකයන් ද ස්ථිර රැකියා ඉල්ලමින් රාජ්‍ය අංශයේ අභ්‍යාසලාභී සේවකයන් ද දොට්ට දැමීම්වලට විරුද්ධව රෙදිපිලි කම්කරුවන් ද සැලකිය යුතු විරෝධතා ව්‍යාපාර පවත්වා ඇත.

හදිසි නීතිය යනු මෙම විරුද්ධත්වය තලා දැමීමේ විධික්‍රමයක් ය යන කරුන මහා ව්‍යාපාරිකයෝ පැහැදිලිව ම දකිති. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික හා කාර්මික මන්ඩලවල ඒකාබද්ධ සංවිධානයක් වන ඒකාබද්ධ ව්‍යාපාරික සංසදය (ජේබිස්), කදිරගාමර් ඝාතනයෙන් පසුව නිවේදනයක් නිකුත් කරමින්, "පර්යාය බිඳ වැටීම" ගැනත් එය ආර්ථිකය හා ආයෝජන මත ඇති කරන බලපෑම ගැනත් සිය "උත්සුකතාව" ප්‍රකාශයට පත් කලේ ය. නීතිය, සාමය හා ස්ථාවරත්වය බලාත්මක කරන ලෙසත් ආර්ථික වර්ධනය පිලිබඳ පොදු න්‍යාය පත්‍රයක් ක්‍රියාවට දමන ලෙසත් එය ඉල්ලා සිටියේ ය.

සිය අගෝස්තු 1 දා ප්‍රකාශයෙන් සසප මෙසේ පැහැදිලි කලේ ය: "මෙම අර්බුදයේ හදවතෙහිම අති මූලික උභතෝකෝටිකයක් පවතී. මහා බලවතුන්ගේ ආධාර ලත් ධනේශ්වරයේ අධිපති කන්ඩායම්, ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීමේ ද ලාභ ශ්‍රම කෙතක් ලෙස දිවයින සකසා ගැනීමේ ද සැලසුම්වල කොටසක් ලෙස, දිග්ගැසී ඇති විනාශකාරී සිවිල් යුද්ධය අවසන් කර දැමිය යුතු යයි බලකරමින් සිටිති. කෙසේ වෙතත්, මුලින් ම යුද්ධයට හේතුකාරක වූ වර්ගවාදී දේශපාලනය, මෙම මූලෝපායට නිරන්තරව බාධා පමුනුවමින් සිටී."

ඊනියා සාම ක්‍රියාදාමයේ අරමුන වූයේ දුර දිග යන ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩපිලිවෙලක් ක්‍රියාවට දමනු හා කම්කරු පන්තිය ඒකාබද්ධව සූරාකෑමේ සිය ප්‍රයත්නය උත්සන්න කරනු පිනිස දිවයිනේ සිංහල, දෙමල හා මුස්ලිම් පාලක ප්‍රභූ කොටස් අතර වාර්ගික පදනමක් මත බලය බෙදා ගැනීමේ ගිවිසුමක් කරා ලඟා වීම යි. එල්ටීටීඊය කදිරගාමර් ඝාතනය කලේ නම්, එමගින් පිලිබිඹු වන්නේ දෙමල ධනේශ්වර තට්ටු අතර පවත්නා ගැඹුරු අසහනය හා අතෘප්තිය යි. වෙනම දෙමල රාජ්‍ය කැබැල්ලක් පිලිබඳ ඉල්ලීම අතහැර තුන් වසරක් ගෙවීමෙන් පසුව, එල්ටීටීඊය සිටින්නේ, කොලඹ ශ්‍රී ලංකා ධනපති පන්තියේ කනිෂ්ඨ හවුල්කරුවකු බවට පත් වීම පිලිබඳ සිය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමෙන් පවා බොහෝ දුරක් මෙපිටිනි.

යලිත් වරක් රට යුද්ධය කරා ඇද දැමීමට සූදානම් වන ධනේශ්වරයේ මොන යම් හෝ දේශපාලන ඒජන්තයකු පිලිබඳ කිසිදු විශ්වාසයක් තැබීම කම්කරුවන්ට කල නො හැකි ය. නොවැලැක්විය හැකි ලෙස ම කම්කරු පන්තියට ඒ සඳහා වන්දි ගෙවීමට බල කෙරෙනු ඇත. වාර්ගික දේශපාලනය නමැති හලාහල විෂ ප්‍රතික්ෂේප කොට ස්වකීය පන්ති අවශ්‍යතා -- ශිෂ්ඨ සම්පන්න ජීවන කොන්දේසි, ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහ සාමය -- ආරක්ෂා කර ගැනීමට ඒකාබද්ධ වන ලෙස සියලු කම්කරුවන්ගෙන් සසප ඉල්ලා සිටී. මෙය සාක්ෂාත් කර ගත හැකි වනු ඇත්තේ, සමාජවාදී ඉදිරිදර්ශනයක් -- එනම්, දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් -- සඳහා සටන් වදිනු පිනිස සිංහල, දෙමල හා මුස්ලිම් වැඩ කරන ජනතාවගේ බලගතු ස්වාධීන ව්‍යාපාරයක් ගොඩනැගීම මගින් ම පමනි.

© www.wsws.org